# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2018

## (AA26) ව්‍යාපාර කළමනාකරණය හා උපාය මාර්ග
(Business Management and strategy)

---

මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C, D** යනුවෙන් කොටස් හතරකින් යුක්තව ප්‍රශ්න 10 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න සඳහා උත්තර ලිවීම අනිවාර්ය වේ.

## A - කොටස
(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය අනු ප්‍රශ්න 10 කින් සමන්විත වන අතර එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20 කි.

අංක 1.1 සිට අංක 1.5 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරාගෙන, තෝරාගත් උත්තරයට අදාල අංකය පමණක් උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව උපදෙස් පිළිපැද උත්තර ඉදිරිපත් කර තිබුණද සුළු අයදුම්කරුවන් පිරිසක් අදාල උපදෙස් පිළිපැද නොමැති බව නිරීක්ෂණය විය.

තෝරාගත් ප්‍රශ්නයට අදාල අංකය උත්තර පත්‍රයේ සඳහන් කළ යුතු වුවද සුළු අයදුම්කරුවන් පිරිසක් අදාල උත්තර ප්‍රශ්න පත්‍රයේම ලියා තිබූ අවස්ථාද දක්නට ලැබුණි. පහසුවෙන් ලකුණු ලබාගත හැකි මෙම ප්‍රශ්නය සඳහා උත්තර නොලියා ප්‍රශ්නය මගහැර තිබූ අවස්ථාද දක්නට ලැබුණි.

1.1 සිට 1.5 දක්වා ප්‍රශ්නවලට උත්තර සැපයීමේදී 1.2 සහ 1.5 ප්‍රශ්න සඳහා සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි උත්තර සපයා නොතිබුණි. 1.2 ප්‍රශ්නයේදී දී ඇති වරණ තුළින් පද්ධති න්‍යායෙහි (system theory) පද්ධතියක සංරචකයක් හඳුනා ගැනීම අවශ්‍ය විය. මෙහිදී නිවැරදි උත්තරය අංක (4) ඉහත සඳහන් සියල්ලම වුවත් සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නයෙහි අඩංගු උත්තරවලට නිසිලෙස අවධානය යොමු නොකිරීම නිසා අනෙකුත් උත්තර තෝරාගෙන තිබෙන දක්නට ලැබුණි.

1.5 ප්‍රශ්නයේදී අවශ්‍ය වූයේ සංස්කෘතික ජාලයේ මූලිකාංගයක් නොවන අයිතමය තෝරා ගැනීමයි. නමුත් සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් "නොවන්නේ" වෙනුවට "වන්නේ" ලෙස සළකා නිවැරදි උත්තරය වන අංක (4) සංවිධානමය මෙහෙවර වෙනුවට වෙනත් වැරදි උත්තර දක්වා තිබුණි.

1.6 සිට 1.10 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය බව උත්තර පත්‍රයේ ලිවිය යුතු විය. බහුතරයක් අයදුම්කරුවන් මේ සඳහා සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණද සමහරු දැනුම නොමැතිකම නිසා හෝ විභාගයට පෙර සූදානමක් නොමැතිවීම නිසා ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අවස්ථාද දක්නට තිබුණි.

විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන ලෙස සකසා ඇති මෙවැනි ප්‍රශ්න සඳහා උත්තර සැපයීමේදී කාලය කළමනාකරණය ගැන අයදුම්කරුවන් අවබෝධයෙන් කටයුතු කළයුතු අතරම උත්තර ලිවීමේදී දී ඇති උපදෙස් නිසි පරිදි අවබෝධ කරගෙන උත්තර සැපයීම කළ යුතු වේ.

# <u>B කොටස</u>

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න පහකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 25 කි.

## ප්‍රශ්න අංක 02

සංවිධානයකට කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් බොහෝ දෙනෙකු සාර්ථක ලෙස උත්තර සපයා ලකුණු ලබාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් සංවිධානයකට කළමනාකරණයේ වැදගත්කම වෙනුවට කළමනාකරණය හැඳින්වීම, කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දීර්ඝ පැහැදිලි කිරීම් කර තිබුණි. දී ඇති ප්‍රශ්නය අවබෝධයෙන් කියවා තේරුම් ගැනීම තුලින් අසා ඇති ප්‍රශ්නයට උත්තර ලිවිය යුතු ආකාරය තේරුම් ගැනීම පහසුය.

## ප්‍රශ්න අංක 03

නිලතන්ත්‍රවාදයේ ලක්ෂණ 5 ක් සඳහන් කිරීමට නියමිතව තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව ලකුණු ලබා තිබූ අතර, සමහර අයදුම්කරුවන්ගේ ලකුණු ලබා ගැනීම ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි. නිලතන්ත්‍රවාදයේ ලක්ෂණ වෙනුවට නිලතන්ත්‍රවාදයේ වාසි, අවාසි සහ නිලතන්ත්‍රවාදයේ වර්ග සඳහන් කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් වැරදි ලෙස චර්යාත්මක ප්‍රවේශයෙහි ලක්ෂණ දක්වා තිබුණි. සමහරු ප්‍රශ්නය තේරුම් නොගෙන උත්තර සපයා තිබූ අවස්ථා අනාවරණය විය. සාර්ථකව උත්තර ඉදිරිපත් කර තිබූ පිරිස ස්ව-අධ්‍යයන පොත හොඳින් පරිශීලනය කර ඇති බැව් නිරීක්ෂණය විය.

සමහර අයදුම්කරුවන් ලකුණු 5 ක් ලබා ගැනීම සඳහා අනවශ්‍ය දීර්ඝ විස්තර කිරීම්ද සිදුකර තිබීම තුලින් අනාවරණය වූයේ නිවැරදිව ප්‍රශ්නය අවබෝධ කර නොගෙන උත්තර සපයා ඇති බවයි. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ කරුණු 5ක් සඳහන් කිරීම පමණක් වුවත් අනවශ්‍ය පැහැදිලි කිරීම් සිදුකර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ගැනත් සැළකිලිමත් වීම වඩාත් වැදගත් වේ.

## ප්‍රශ්න අංක 04

සඵලදායි සන්නිවේදනය පවත්වා ගැනීමට සංවිධානයක කළමනාකරුවෙකු සඳහා අවශ්‍ය කුසලතා පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය තේරුම් නොගෙන කළමනාකරණ කුසලතා ඉදිරිපත් කර තිබූ අවස්ථා දක්නට ලැබුණු අතර, සැළකිය යුතු පිරිසක් සාර්ථක උත්තර ඉදිරිපත් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් සන්නිවේදනය හා සන්නිවේදන මාර්ග දීර්ඝ ලෙස විස්තර කර අනවශ්‍ය කරුණු ඉදිරිපත් කර තිබූ අවස්ථා අනාවරණය විය. ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන උත්තරය පිළිබඳව නිසි අවබෝධයක් ඇත්නම් අනවශ්‍ය දෑ ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටිය හැකිය. ස්ව-අධ්‍යයන පොත නිසිලෙස පරිශීලනය නොකිරීම හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය.

## ප්‍රශ්න අංක 05

උපක්‍රමික පාලනය සහ මෙහෙයුම් පාලනය අතර වෙනස්කම් 5 ක් සඳහන් කිරීමට ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් අඩකට වඩා පිරිසක් ප්‍රශ්නය හරිහැටි තේරුම් නොගෙන උපක්‍රමික පාලනය සහ මෙහෙයුම් පාලනය පිළිබඳව අවබෝධයෙන් තොරව උත්තර ලියා ඇති බවක් දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් උපක්‍රමික පාලනය (strategic control) සහ මෙහෙයුම් පාලනය (operational control) අතර වෙනස්කම් සඳහන් කිරීම වෙනවට උපක්‍රමික පාලනය සහ මෙහෙයුම් පාලනය වෙනවෙනම පැහැදිලි කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලබා ගත් ලකුණු පහළ මට්ටමක පැවතුණි. ස්ව-අධ්‍යයන පොත හොඳින් පරිශීලනය නොකිරීමත් විභාගය සඳහා පෙර සූදානම් වීම අඩුබවත් හේතූන් ලෙස නිරීක්ෂණය විය.

## ප්‍රශ්න අංක 06

සංවිධානයකට නායකත්වය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු 5 ක් සඳහන් කරන ලෙස දක්වා තිබුණි. කළමනාකරණයේ ප්‍රාථමික දැනුම ඇති අයෙකුට වුවත් සංවිධානයකට නායකත්වය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු 5 ක් සඳහන් කර මුළු ලකුණු ලබාගැනීමට හැකියාව තිබුණි. එහෙත් අයදුම්කරුවන් අතලොස්සක් එකම කරුණු, එකම අදහස කිප වතාවක් සඳහන් කරමින් උත්තර ලියා තිබූ අවස්ථා දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් නායකත්වය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු සඳහන් කිරීම වෙනුවට නායකත්ව න්‍යායන් සහ නායකත්වය පිළිබඳ විවිධ වර්ගීකරණයන් වැනි අදාලත්වයෙන් තොර කරුණු දක්වා තිබුණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීම සතුටුදායක මට්ටමක පැවති බව අනාවරණය විය.

<u>**C කොටස**</u>

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

මෙම කොටස සඳහා ප්‍රශ්න අංක 7 සිට 9 දක්වා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගතහැකි මුළු ලකුණු ප්‍රමාණය 30 කි.

## ප්‍රශ්න අංක 07

තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යොමුකර ඇති මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය. පළමු කොටසින් තාර්කික තීරණ ගැනීමට ඇති බාධා 4 ක් සඳහන් කිරීමට ලකුණු 4 ක් වෙන්කර දී තිබුණි. මෙහි දෙවන කොටසින් තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ පියවරයන් පැහැදිලි කරන ලෙස දන්වා තිබූ අතර, ඒ සඳහා ලකුණු 6 ක් වෙන්කර දී තිබුණි.

මෙහි පළමු කොටස සඳහා ලබාදී තිබුණු උත්තර සතුටුදායක මට්ටමක පැවතුණි. ප්‍රායෝගික දැනුම හා සාමාන්‍ය දැනුම ඇත්නම් තීරණ ගැනීමට ඇතිවිය හැකි බාධා 4 ක් සඳහන් කිරීමෙන් පමණක් මුළු ලකුණු ලබාගැනීමට අවස්ථාව තිබුණි. තාර්කික තීරණ ගැනීමට පවතින බාධා වෙනුවට තාර්කික තීරණ ගැනීමේ තත්ත්වයන් හා ප්‍රවේශයන් සම්බන්ධව අදාල නොවන කරුණු දක්වා තිබූ අවස්ථා දක්නට ලැබුණි. ඇතිවිය හැකි බාධා කරුණු වශයෙන් 4 ක් සඳහන් නොකර එකම කරුණු කිප වතාවක් ලියා තිබූ අවස්ථා දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධ පියවරයන් ඉදිරිපත් කර ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් මේ පිළිබඳව කිසිම අවබෝධයක් නොමැතිව තීරණය ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ නිශ්චිත නොවන සහ අදාල නොවන කරුණු උත්තර ලෙස ඉදිරිපත් කර තිබුණි. සමහර අයදුම්කරුවන් පියවරයන් පැහැදිලි කිරීමකින් තොරව අදාල පියවරයන් සඳහන් කිරීම පමණක් කර තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි පියවරයන් වල අනුපිළිවෙල මාරුකොට දක්වා තිබුණි.

## ප්‍රශ්න අංක 08

අභිප්‍රේරණය සම්බන්ධයෙන් යොමුකරන ලද ප්‍රශ්නයකි. ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වූ අතර, පළමු කොටසට ලකුණු 4 ක් හා දෙවන කොටස සඳහා ලකුණු 6 ක් වෙන්කර තිබුණි.

මෙහි පළමු කොටසින් කාර්යයාධනය සහ සේවක අභිප්‍රේරණය අතර ඇති සම්බන්ධතාවය විමසීමත්, දෙවන කොටසින් මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය යටතේ පෙන්වා ඇති අවශ්‍යතා 3 ක් පැහැදිලි කරන ලෙසත් දක්වා තිබුණි.

ප්‍රශ්නයෙහි (a) කොටස සඳහා අයදුම්කරුවන් බහුතරයක් නිවැරදිව උත්තර සපයා නියමිත ලකුණු ලබා ගැනීමට සමත් වී තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් අනෙකුත් අදාල කරුණු ඉදිරිපත් නොකළද මෙම සංකල්ප දෙක (2) අතර අනුලෝම (ධන) සබඳතාවයක් පවතින බවට හඳුනාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් සුළු පිරිසක් කාර්යසාධනය නිසා අභිප්‍රේරණය වැඩිවන බවට විග්‍රහ කරමින් මෙම සංකල්ප දෙක වරදවා අවබෝධ කරගෙන ඇති බවත් නිරීක්ෂණය විය. තවත් සමහරු සේවකයින් අභිප්‍රේරණය කළ හැකි ක්‍රම පිළිබඳව දීර්ඝ විස්තර සපයමින් ප්‍රශ්නයට අදාල නොවන උත්තර ඉදිරිපත් කර ඇති අවස්ථා දකිනට තිබුණි.

ප්‍රශ්නයෙහි (b) කොටස සඳහා අයදුම්කරුවන් විශාල පිරිසක් ඉතාමත් සාර්ථක ලෙස උත්තර සපයා වැඩි ලකුණු ලබාගෙන තිබුණි. මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය හොඳින් අධ්‍යයනය කර ඇති බවත් නිරීක්ෂණය විය. අවශ්‍යතා ධූරාවලිය රූප සටහන් මගින් ඉදිරිපත් කර එක අවශ්‍යතාවයකින් තෘප්තිමත් වූ පසු ඊළඟ අවශ්‍යතාවය තෘප්තිමත් කරගැනීමට උත්සහා දරණ බවට පැහැදිලි ලෙස උදාහරණ දක්වමින් කරුණු ඉදිරිපත් කළ අවස්ථා බොහොමයක් දක්නට ලැබුණි. සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහාද අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉහළ මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 09

සංවිධානයකට ඇති සමාජ වගකීම් පිළිබඳ අසන ලද ප්‍රශ්නහේ පළමු කොටසින් ආයතන සමාජ වගකීමෙහි [Corporate Social Responsibility (CSR)] මට්ටම් 3 ක් පැහිදිලි කරන ලෙස දක්වා තිබූ අතර, ඒ සඳහා වෙන්කළ ලකුණු ප්‍රමාණය 6 කි. මෙහි දෙවන කොටසින් සංවිධානයකට සංස්කෘතියේ ඇති වැදගත්කම සඳහා හේතුන් 4 ක් සඳහන් කිරීමට වෙන්කළ ලකුණු ප්‍රමාණය 4 කි.

ප්‍රශ්නයෙහි (a) කොටස සඳහා සමහර අයදුම්කරුවන් ආයතනික සමාජ වගකීමෙහි මට්ටම් වෙනුවට ආයතනික සමාජ වගකීම් යනු කුමක්දැයි පැහැදිලි කරමින් අදාල නොවන උත්තර සපයා තිබුණි.

මෙම ප්‍රශ්නය බොහෝ අයදුම්කරුවන් තේරුම් නොගත් බවත් පැහැදිලිව දක්නට ලැබුණි. සමස්තයක් ලෙස ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. සමහර අයදුම්කරුවන් පිළිගත නොහැකි සහ අදාල නොවන කරුණු ලියා තිබීමෙන් පෙනී යන්නේ ප්‍රශ්නය අවබෝධ කරගෙන නොමැති බවය. ඉතාමත් සුළු පිරිසක් සාර්ථක ලෙස උත්තර ඉදිරිපත් කර මුළු ලකුණු ප්‍රමාණයම ලබාගත් අවස්ථා දක්නට ලැබුණි.

ප්‍රශ්නයෙහි (b) කොටස සඳහා සංවිධානයකට සංසකෘතියේ ඇති වැදගත්කම සඳහා හේතු සඳහන් කිරීමේදී ඒවා පැහැදිලි කිරීම්ද සිදුකර තිබූ අවස්ථා දක්නට ලැබුණි.

<u>**D කොටස**</u>

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

සිද්ධි අධ්‍යයන ප්‍රශ්නයකි. ඉදිරිපත් කරන ලද සිද්ධියට අදාලව න්‍යායාත්මක කරුණු ගොනුකරන ආකාරය පරීක්ෂා කිරීමට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. (a), (b), (c) සහ (d) යනුවෙන් කොටස් 4 කින් ප්‍රශ්නය සමන්විතය.

<u>**(a) කොටස**</u>

මෙම කොටසින් **සීමාසහිත සුපුල් ගෘහභාණ්ඩ සමාගම** වෙනස්වන පරිසරය තුළ මුහුණ පා සිටින අභියෝග 3 ක් පැහැදිලි කරන ලෙස දක්වා තිබුණි. දී ඇති සිද්ධිය අවබෝධයෙන් කියවීම තුලින් මෙම සමාගමට වෙනස්වන පරිසරය තුළ මුහුණපා ඇති අභියෝග පැහැදිලිව හඳුනාගත හැකි වේ. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අදාල සිද්ධිය අධ්‍යයනය කර ක්‍රමවත්ව කරුණු ඉදිරිපත් කර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් කරුණු පැහැදිලි කිරීමෙන් තොරව සඳහන් කර තිබුණි. ලකුණු 6 කට සීමාවූ මෙම කොටස සඳහා දීර්ඝ විස්තර ඉදිරිපත් කළ අයද දක්නට ලැබුණි. සිද්ධි අධ්‍යයනයෙන් බාහිරව සංවිධානයක් මුහුණපා සිටින අභියෝග සඳහන් කර තිබූ අවස්ථාද දක්නට ලැබුණි. වඩාත් වැදගත් වන්නේ සිද්ධි අධ්‍යයනය තුලින් දැකිය හැකි වෙනස්වන පරිසරය තුළ සමාගම විසින් මුහුණ පා සිටින අභියෝග හඳුනා ගැනීමටයි. බහුතර අයදුම්කරුවන් සාර්ථකව උත්තර ඉදිරිපත් කර තිබූ අතර, සුළු පිරිසක් අසාර්ථක, අදාල නොවන කරුණු ඉදිරිපත් කල අවස්ථාද දක්නට ලැබුණි.

<u>**(b) කොටස**</u>

මෙම කොටස සෘජුවම න්‍යායාත්මක කරුණු ඇසුරෙන් උත්තර ලිවීමට ප්‍රශ්නය ඉදිරිපත් කර තිබුණි. ශ්‍රිතමය සංවිධාන ව්‍යුහයක් තිබීමේ වාසි හතරක් (4) සහ අවාසි හතරක් (4) සඳහන් කිරීමට නියමිතව තිබුණි. අයදුම්කරුවන්ගෙන් අඩකට වඩා පමණ සාර්ථකව උත්තර සපයා තිබූ අතර, ශ්‍රිතමය සංවිධාන ව්‍යුහයක වාසි අවාසි ඉදිරිපත් කිරීමේදී සිද්ධිය තුළ අන්තර්ගත වූ කරුණු තුලින් උත්තර සැපයීමට උත්සාහ දරණ ලද බවත් දක්නට ලැබුණි. සමස්තයක් ලෙස ලකුණු මට්ටම ඉහළ කාර්යසාධන පැවතුණි.

**(c) කොටස**

මෙම කොටසින් සුපුල් ගෘහභාණ්ඩ සමාගමට පරිසරයෙන් වන බලපෑම ශදූඅත (SWOT) විශ්ලේෂණය භාවිත කරමින් තක්සේරු කිරීමට නියමිතව තිබුණි. අදාල සිද්ධිය මගින් පමණක් කරුණු ඉදිරිපත් කර උත්තර සැපයීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගතහැකි වුවත් ඇතැම් අය වෙනත් කරුණු මගින් ශදූඅත (SWOT) විශ්ලේෂණය කර තිබූ අවස්ථා දක්නට ලැබුණි. ශදූඅත විශ්ලේෂණය ගැන මනා අවබෝධත් ඇති අයදුම්කරුවන් සිද්ධියෙහි ඇති කරුණු නිසිලෙස වෙන්කර විශ්ලේෂණය කර තිබූ අතර ඉතා සුළු කොටසක් අවබෝධයෙන් තොරව උත්තර ලියා තිබුණි. සමස්තයක් ලෙස කාර්යසාධනය ඉහළ මට්ටමක පැවතුණි.

**(d) කොටස**

මෙම කොටසට ඉතාමත් දුර්වල මට්ටමක උත්තර සපයා තිබුණි. පෝටර්ගේ වටිනාකම් දාම ආකෘතියේ ප්‍රථමික ක්‍රියාකාරකම් 3 ක් සඳහන් කිරීමට නියමිතව තිබුණත් සාර්ථකව උත්තර සපයා ලකුණු ලබා තිබුණේ අයදුම්කරුවන්ගෙන් අතලොස්සකි. පෝටර්ගේ වටිනාකම් දාම ආකෘතියෙහි ප්‍රාථමික ක්‍රියාකාරකම් වෙනුවට සහායක ක්‍රියාමාර්ග සඳහන් කර තිබූ අවස්ථාද විය. ස්ව-අධ්‍යයන පාඨමාලාව පරිශීලනය කර තිබුණේනම් මෙවැනි දුර්වලතාවයන් මගහරවා ගතහැකිව තිබුණි.

- - -

**අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කියවීමේ කාලයක් ලබා දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කිප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා සෘජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරික්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ඒඒටී ආයතනය මගින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, ලිපි සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පසුගිය විභාග වල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * * -